# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1864/2 - 2014 මැයි මස 26 වැනි සඳුදා - 2014.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත

3 වෙනි වගන්තිය යටතේ නියෝගය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44(2) වැනි වගන්තිය සමග කියවිය යුතු 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 3 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මහින්ද රාජපක්ෂ වන මම මෙම නියෝගය මගින්, එම වගන්තිය යටතේ පනවන ලද 2006 ඔක්තෝබර් 05 වන දින සහ අංක 1465/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගය (2013 මැයි 10 හා අංක 1809/19 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද නියෝගයෙන් අවසන්වරට සංශෝධනය කරන ලද පරිදි) උපලේඛනයේ දැක්වෙන පරිදි සංශෝධනය කරමි.

මහින්ද රාජපක්ෂ,<br>
ජනාධිපති,<br>
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍ය.

2014 මැයි මස 26 වැනි දින,<br>
මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය,<br>
කොළඹ.

### උපලේඛනය

එම උපලේඛනයේ 06 අයිතමය පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ :-

"06. යම් සමාගමක යම් කොටස් සංඛ්‍යාවක් නිකුත් කිරීමක්, මාරු කිරීමක් හෝ පැවරීමක් මත නිකුත් කළ යම් කොටස් සහතිකයක්

එවැනි කොටස්වල මුළු වටිනාකමෙහි සෑම රු.1000 ක් හෝ ඉන් කොටසක් සඳහා එවන් මාරු කිරීමක් හෝ පැවරීමක් නිකුත් කරන දිනට විවෘත වෙළඳපොලේ එවන් කොටස් සඳහා උපයා ගත හැකි වනු ඇතැයි තක්සේරුකරු/සහකාර කොමසාරිස්/නියෝජ්‍ය කොමසාරිස්/ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය කොමසාරිස් නිගමනය කරනු ලබන වටිනාකම." — රු. 5.00

06 - 565


1A - PG 2070 — 450 (2014/06) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*